


# 8 විද්‍යුත් ප්‍රදර්ශක

මෙම පාඩම හැදෑරීමෙන් ඔබට,

- ප්‍රදර්ශකයක් යනු කුමක් ද?
- විද්‍යුත් ප්‍රදර්ශකයක අඩංගු ගුණාංග
- දෘශ්‍ය තිර පසුතලය, දෘශ්‍ය තිර ආකෘති, දෘශ්‍ය තිර සැලසුම් වෙනස් කිරීම
- ප්‍රදර්ශකයක අඩංගු දෘශ්‍ය රාමු තුළට සුදුසු පින්තූර හෝ රූප සටහන් ඇතුළු කිරීම
- ප්‍රදර්ශකයට සජීවීකරණ ආදේශ කිරීම
- ප්‍රදර්ශක මෘදුකාංගවල ඇති මූලික ලක්ෂණ භාවිත කරමින් සිත්ගන්නා සුලු ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම

පිළිබඳ ව මනා අවබෝධයක් ලබා ගැනීමට හැකි වනු ඇත-

## 8.1 ප්‍රදර්ශකයක් යනු කුමක් ද? එය අපට අවශ්‍ය වන්නේ ඇයි ?

එදිනෙදා ජීවිතයේ දී විවිධ වූ ප්‍රදර්ශක අපට හමුවේ. උදාහරණ ලෙස, ඔබගේ පන්ති කාමරයට පැමිණි ගුරුතුමා හෝ ගුරුතුමිය ඔබ වෙනුවෙන් පාඩම් ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කළ ක්‍රියාමාර්ග කෙබඳු ද? ඔබ පාසල් පැමිණෙන විට බස් නැවතුම්පළ අසල හෝ වෙළෙඳපොළ අසල හෝ පදික වේදිකාවේ සිට හෝ තම නිෂ්පාදන අලෙවි කර ගැනීමට වෙළෙඳ මහතකු දරන උත්සාහය සිහියට නගා ගන්න. එසේත් නැතහොත් මහජන සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ වෛද්‍ය නිලධාරින් පැමිණ ඔබ පාසලේ හෝ ගමේ ප්‍රජා ශාලාවේ දී ප්‍රේක්ෂකයින් දැනුවත් කිරීමට ගත් උත්සාහය කෙසේ දැයි මෙනෙහි

කරගන්න. අප එදිනෙදා ජීවිතයේ අත්විඳින මෙවැනි අවස්ථාවන් සමස්තයක් වශයෙන් ගත් කල ඉන් සිදුවන්නේ එක ම ආකාරයේ ක්‍රියාවලියකි. එනම් යම් පුද්ගලයකු හෝ කිහිප දෙනෙකු එක් ව ඔවුන්ගේ අදහස්, මතිමතාන්තර හෝ දැනුම, වැඩි ප්‍රේක්ෂක පිරිසකට එක වර ලබා දීමට ගන්නා ප්‍රයත්නයකි. එවැනි අවස්ථාවල දී පුද්ගලයන් කිසියම් නිරූපණයක් කරනු ලබන අතර එම කාර්යය පහසුකර ගැනීම සඳහා විවිධ වූ මෙවලම් ද භාවිත කරනු දැකිය හැකි ය. අවශ්‍යතාවට අනුව විවිධ මෙවලම් ද භාවිත කර ගනිමින් ප්‍රේක්ෂකයින්ට නිසි අවබෝධයක් ලබා දීමට නිරූපකයා හෙවත් ඉදිරිපත්කරන්නා (Presenter) යොදා ගන්නා ක්‍රමවේදය සමස්තයක් ලෙස ප්‍රදර්ශක (Presentations) ලෙස හැඳින්වෙයි. සමහර අවස්ථාවල දී මෙය සමර්පනය ලෙස ද හඳුන්වා ඇත.

මීට දශක එකහමාරකට පමණ පෙර ප්‍රේක්ෂකයාට තම අදහස් ඒත්තු ගැන්වීමේ දී බහුල ව යොදාගනු ලැබූ ක්‍රමවේදය වූයේ ඊට අදාළ වන පරිදි සකස් කර ගන්නා ලද බැනර් (Banners), පෝස්ටර් (Posters) හෝ එකතු කර ගන්නා ලද උපකරණ කිහිපයක් සමග තම කායික හා මානසික ශ්‍රමයයි. එවන් පරිසරයක් තුළ ප්‍රදර්ශකයා හෝ නිරූපකයාගේ කුසලතාව සහ යොදා ගන්නා ලද මෙවලම් හෙවත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ වල අදාළත්වය ද යන කරුණු මත ප්‍රදර්ශකයේ සාර්ථකත්වය තීරණය වේ. යම් හෙයකින් ප්‍රදර්ශක කාර්යයේ යෙදෙන්නාගේ කථන හා නිරූපණ කුසලතා මට්ටම පහළ තලයක පැවතියහොත් සහ ඒ සමඟ ම ඔහු හෝ ඇය යොදා ගත් ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ද ඊට නොගැළපෙන ඒවා වූ විට ප්‍රේක්ෂකයන් තෘප්තිමත් කිරීම සහ ඔවුන් තමා වෙත අවනත කර ගැනීම අපහසු වනු ඇත. ඒ අනුව ප්‍රදර්ශක කාර්යයේ දී ඒ ඒ විෂයයනට අදාළ ව පුළුල් දැනුමක් සමඟ කුසලතා ද ප්‍රදර්ශකයා සතු ව තිබිය යුතු අතර ම කරුණු පැහැදිලි කිරීමට සුදුසු ශ්‍රව්‍ය දෘශ්‍ය මෙවලම් භාවිතය ද අත්‍යවශ්‍ය අංගයක් වී ඇත.




**ක්‍රියාකාරකම 8.1**

පන්ති කාමරයේ දී සහ ඉන් බැහැර ව ප්‍රේක්ෂකයකු වශයෙන් ඔබ සම්බන්ධ වූ ප්‍රදර්ශක අවස්ථා අතුරින් වඩාත් සිත්ගත් අවස්ථා තුනක් සැකෙවින් දක්වන්න.

## 8.2 විද්‍යුත් ප්‍රදර්ශකයක් (Electronic Presentation) යනු කුමක් ද?

ආරම්භයේ දී පුද්ගලයන් තම මානසික හා කායික ශක්තිය මත පිහිටා නිර්මාණය කළ ප්‍රදර්ශකය (Conventional presentations) පසු ව එක්වූ විද්‍යුත් මෙවලම් ඒකාබද්ධ වීම නිසා බොහෝ දුරට පරිගණකගත ක්‍රියාවලියක් බවට පත් විය. අද ඒ සඳහා අවශ්‍ය විශාල මෙවලම් ප්‍රමාණයක් (සංඛ්‍යාංක කැමරා (Digital camera), ශබ්ද පටිගතකරහැකි හෝ තැටිගත කළහැකි යන්ත්‍ර (Sound Recorders) වැනි.) අන්තර්ජාලය වැනි සම්පත් මූලාශ්‍ර හරහා ලබා ගත හැකි වීම නිසා මෙය පහසු කාර්යයක් බවට පත් ව ඇත. තව ද නවීන විද්‍යුත් මෙවලම් සමඟ ම ක්‍රමශිල්පවල ද දක්නට ලැබෙන වෙනස්කම් නිසා අද නිර්මාණය වන ප්‍රදර්ශකයන් විද්‍යුත් ප්‍රදර්ශකයන් ලෙස සැකසෙනවා පමණක් නොව ඒවා කෙටි කලක් තුළ නිමවන ගුණාත්මක අතින් ඉහළ ප්‍රදර්ශකයන් වීමට ද හේතු වී ඇත.



**ක්‍රියාකාරකම 8.2**

සාමාන්‍ය ප්‍රදර්ශකයක් හා විද්‍යුත් ප්‍රදර්ශකයක් අතර ඔබට හඳුනා ගත හැකි මූලික වෙනස්කම් පහක් ලැයිස්තු ගත කරන්න.

## 8.3 ප්‍රදර්ශකයන් පිළිබඳ අප දැනුවත් විය යුත්තේ ඇයි ?

ප්‍රේක්ෂකයාට කරුණු වටහා දීම හොඳින් සිදු කිරීමට ප්‍රදර්ශකය භාවිතය වර්තමානයේ දී සෑම ක්ෂේත්‍රයක් තුළ ම බහුල ව සිදු වේ. උදාහරණ වශයෙන් අධ්‍යාපන හෝ අධ්‍යයන කටයුතු සඳහා පාඩම් ඉදිරිපත් කිරීම, නව නිමැවුම් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම, වාර්තාමය තොරතුරු ගෙන හැර දැක්වීම යනාදිය සම්පූර්ණයෙන් ම පාහේ සිදුවන්නේ ප්‍රදර්ශක ඇසුරිනි. එබැවින් ප්‍රදර්ශකයක අන්තර්ගත කළ යුතු හෝ නොකළ යුතු දේ පිළිබඳ ව ද ප්‍රේක්ෂකයා ග්‍රහණය කරගැනීමට භාවිත කළ යුතු උපක්‍රම පිළිබඳ ව ද තමා ප්‍රකාශ කිරීමට යන අදහස ප්‍රදර්ශකය තුළ නිවැරැදි ලෙස අන්තර්ගත ව ඇද්ද හෝ නැද්ද යන්න පිළිබඳ ව ද කරුණු සනාථ කිරීම සඳහා යොදාගෙන ඇති විස්තර හා රූප රාමුවල උචිත බව ආදිය පිළිබඳ ව ද මනා අවබෝධයකින් යුතු ව ප්‍රදර්ශකයා එය නිර්මාණය කළ යුතු ය.

පාසල තුළ දී හෝ ඔබගේ පන්ති කාමරයේ දී හෝ වෙනත් කිසියම් තැනක දී හෝ ඔබට ද ප්‍රදර්ශන කාර්යයක නිරත වීමට සිදුවිය හැකි බැවින් ඒ පිළිබඳ පූර්ව අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. එසේ ම අනාගතයේ ඔබ පිවිසෙන සමාජය තුළ ඔබට පැවරෙන වගකීම කුමක් වුවත් ඒ තුළ ද මෙවන් ක්‍රියාකාරකම් සිදුවන බැවින් ඒ පිළිබඳ ව ද ඔබ දැනුවත් ව සිටීම වෘත්තීයමය වශයෙන් වුව ද ඔබට පහසුවක් වනු ඇත.

## 8.4 ප්‍රදර්ශක මෘදුකාංග (Presentation Software)

ප්‍රදර්ශක මෘදුකාංග යන්නෙන් අදහස් කරනු ලබන්නේ යම් කිසි මාතෘකාවක් හෝ සිද්ධියක් වටා ගොනු කර ගත හැකි කරුණු සමූහයක් වඩාත් ක්‍රමානුකූල ව හා අනුපිළිවෙළින් අන් අයට ඉදිරිපත් කිරීමට සහාය වන්නා වූ බහුමාධ්‍ය ලක්ෂණ අන්තර්ගත මෘදුකාංග විශේෂයකි. පරිගණක සහ ප්‍රදර්ශක මෘදුකාංග බහුල ව භාවිත නොවුණු වකවානුව තුළ යම් යම් නිරූපණ කාර්යයන්හි යෙදෙන්නන් ප්‍රදර්ශක ලෙස භාවිත කරනු ලැබුවේ අදාළ තොරතුරු ඇතුළු කොට සකසා ගන්නා ලද බැනර, පෝස්ටර, දෘශ්‍යාධාරක හෝ සපයාගත හැකි නම් පමණක් සැබෑ මෙවලම් ආදිය බව කලින් සඳහන් කෙරිණි. නමුත් වර්තමානයේ ප්‍රදර්ශක මෘදුකාංගවල ප්‍රවණතාවත් සමග නිරූපණ කාර්යයන්හි යෙදෙන්නන් තම කාර්යයන් පහසු කරගැනීමට මෙන් ම එය වඩාත් හොඳින් ඉදිරිපත් කිරීමට ප්‍රදර්ශක මෘදුකාංග යොදාගනු දක්නට ඇත.

ප්‍රදර්ශක මෘදුකාංගයක් භාවිත කරනු ලබන්නේ අදළ විෂය කරුණු පැහැදිලි කිරීමට අවශ්‍යවන ප්‍රදර්ශක දෘශ්‍යරාමු (Presentation slides) සකසා ගැනීමට වන අතර එවැනි දෘශ්‍ය රාමු තුළට අදාළ තොරතුරු අකුරු (Characters), ඉලක්කම් (Numbers), පින්තූර (Pictures /Graphics/Images), වගු සහ ප්‍රස්ථාර (Tables and Graphs), වීඩියෝ දර්ශන සහ චලනමය සිතුවම් (Videos and Movies), හඬ (Voice) සහ ශබ්ද (Sound) යනාදී ආකාරයෙන් ඇතුළු කළ හැකි ය. මෙසේ මාධ්‍ය රාශියක් දෘශ්‍ය රාමු තුළට ගොනු කරමින් ප්‍රදර්ශක නිර්මාණය කළ හැකි බැවින් මේවා බහු මාධ්‍ය ප්‍රදර්ශක (Multimedia presentations) ලෙස ද හඳුන්වනු ලබයි.

යම් අයකු සඳහා කරුණු පැහැදිලි කර දීමට අප විසින් භාවිත කරනු ලබන ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍යයන් ඇතුළු කොට දෘශ්‍ය රාමු මගින් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය මූලික සැකසුම හෙවත් දෘශ්‍ය රාමු එකතුවක් ද (Slide show) ගොඩනැගිය හැක. මෙවන් ඉදිරිපත් කිරීමක් සැකසීමට අවශ්‍ය මූලික පහසුකම් සියල්ල ම පාහේ ප්‍රදර්ශක මෘදුකාංගවල අන්තර්ගත ව ඇත.

## 8.5 ප්‍රදර්ශක මෘදුකාංගවල පොදු ගුණාංග

පොදුවේ ගත්කල සෑම ප්‍රදර්ශක මෘදුකාංගයක් ම

1. ප්‍රදර්ශකය සහ ඉදිරිපත් කරන්නා අතර සහයෝගීතාව වැඩි දියුණු කරයි.
2. ප්‍රදර්ශකය සහ ප්‍රේක්ෂකයා අතර සබඳතාව ඉහළ නංවයි.
3. වඩා ප්‍රබල සන්නිවේදනයකට මග පාදයි.
4. ඉදිරිපත් කරන්නාට අඩු ශ්‍රමයකින් වැඩි කාර්යභාරයකට ඉඩ සලසයි.
5. තොරතුරු පහසුවෙන් මෙන් ම ක්‍රමවත් ව සංවිධානය කරගැනීමට අවස්ථා සලසයි.
6. අවශ්‍යතාවන්ට අනුකූල වන පරිදි දෘශ්‍යරාමු පිරිසැලසුම් (Slide Layouts) තෝරා ගැනීමට ඉඩ ලබාදෙයි.
7. සජීවී ප්‍රදර්ශකයක් සැකසීමට සහ ඉදිරිපත් කිරීමට අවකාශ සලසයි.
8. එකිනෙකට වෙනස් පෙර සැලසුම් අච්චු (Design Template) ලබාදෙයි.
9. ඒකාකාරී නොවන පරිදි අදහස් ඉදිරිපත් කිරීමට බහුමාධ්‍ය සබඳතාව ගොඩනගයි.
10. තේමාව කුමක් වුවත් ඊට අවශ්‍ය පසුතලයක් සකසනු ලබයි.
11. ප්‍රදර්ශකයාගේ හසුරු කුසලතාව වැඩි දියුණු කිරීමට ඉඩකඩ පාදයි.

## 8.6 ප්‍රදර්ශක මෘදුකාංගවලට උදාහරණ

ලොවපුරා පරිගණක ආශ්‍රිත ව අද භාවිත වන ප්‍රදර්ශක මෘදුකාංග සංඛ්‍යාත්මක ව ඉහළ අගයක් ගනී. පහත සඳහන් කර ඇත්තේ ඉන් කිහිපයක් හා ඒවා නිපදවන ලද ආයතනවල ලැයිස්තුවකි.

| මෘදුකාංගයේ නම | නිපදවන ලද ආයතනය |
|---|---|
| • AppleWorks | Apple Inc. |
| • Apple Keynote | Apple Inc. |
| • Beamer(LaTex) | Till Tantu. |
| • Google Docs | Google Inc |
| • Harvard Graphics | Software Publishing Corporation. |
| • Lotus Freelance Graphics | IBM. |
| • KPresenter | KPresenter Team. |
| • MagicPoint | WIDE Project. |
| • Microsoft PowerPoint | Microsoft Corporation. |
| • Neo Office Impress | Planamesa Software. |
| • Open Office.org Impress | Sun Microsystems. |
| • SongPro | Creation Software Limited. |
| • VCN ExecuVision | Visual Communication Network Inc. |

**සටහන** ： සමහර ප්‍රදර්ශක මෘදුකාංග දැනට භාවිතයෙන් ඉවත් වී ඇති බව ද සලකන්න.




ඉහත දක්වා ඇති මෘදුකාංග ලැයිස්තුව යොදාගෙන එයින් අපට මුදල් ගෙවීමකින් තොර ව ලබාගත හැකි මෘදුකාංග (Free and Open source software) හා මුදල් ගෙවා ලබාගත හැකි මෘදුකාංග (Retail or purchase software) වෙන්කර දක්වන්න.

(මේ සඳහා අන්තර්ජාල පහසුකම් ඇත්නම් යොදා ගැනීමට සැලකිලිමත් වන්න.)

## 8.7 විද්‍යුත් ප්‍රදර්ශක (Electronic Presentations)

### විද්‍යුත් ප්‍රදර්ශකයක දෘශ්‍ය රාමු පසුතලය (Slide Background of Electronic Presentations)

ප්‍රදර්ශකයක පසුබිම කෙරෙහි අවධානය පිටු සැකැස්මෙන් ඇරඹෙන අතර ඊට ගැළපෙන වර්ණ, අකුරු වර්ග, සටහන්, පින්තූර ආදියත් ඒවායේ ප්‍රමාණයත් සුවිශේෂ කරුණු ලෙස සඳහන් කළ හැක. ප්‍රමාණයට වඩා පසුබිමෙහි සංකීර්ණ බව හෝ සරල බව නිසා එහි ඵලදායිතාව අඩු විය හැකි ය. ප්‍රදර්ශක පසුතලයෙන් මූලික ව ම බලාපොරොත්තු වන්නේ ප්‍රේක්ෂකයාට යෝග්‍ය දසුනක් නිර්මාණය කිරීමයි.

### විද්‍යුත් ප්‍රදර්ශකයක දෘශ්‍ය රාමු පිරිසැලසුම් (Slide Layouts of Electronic Presentations )

ඉහත දක්වන ලද ආකාරයට ප්‍රදර්ශකයේ පසුතලය හෝ පසුබිම ගැන හොඳින් සලකා බැලිය යුතු අතර ම දෘශ්‍ය රාමු පිරිසැලසුම් (8.4 රූපය බලන්න) ගැන ද සැලකිලිමත් විය යුතු ය. එයට හේතුව ඔබට තහවුරු කිරීමට අවශ්‍ය කරුණු ඉදිරිපත් කිරීමට යොදා ගත් තිර ආකෘතිය ඊට මනා ව ගැළපෙන නමුත් එහි පසුතලය ඊට සුදුසු පරිදි හැඩ ගැන්වී නොමැති අවස්ථාවක එහි ගුණාත්මක බව අඩු විය හැකි බැවිනි. කෙසේ නමුත් දෘශ්‍යතිර පිරිසැලසුම් තෝරා ගැනීමේ මූලික අරමුණ විය යුත්තේ ප්‍රදර්ශකය තුළට ඇතුළු කිරීමට සිදුවන විෂය කරුණු වන පාඨ, සටහන්, වගු, ප්‍රස්ථාර, චලන හෝ නිශ්චල රූප ආදි තොරතුරු පහසුවෙන් ඇතුළු කිරීමට උචිත සැලැස්මක් හෝ ආකෘතියක්, පවතින පිරිසැලසුම් අතුරින් නිවැරැදි ව තෝරා ගැනීම ය.

## විද්‍යුත් ප්‍රදර්ශකයක දෘශ්‍යරාමු සැලසුම් (Slide Designs of an electronic presentation)

ඔබ විසින් භාවිත කරනු ලබන කුමන ප්‍රදර්ශක මෘදුකාංගයක වුවත් දෘශ්‍යරාමු සැලසුම් (Slide Design), පෙර සැලසුම් අච්චු (Design Templates) වශයෙන් ද ඇතුළු කර ඇති නිසා ඔබට ගැළපෙන දෘශ්‍යරාමු සැලසුමක් (8.5 රූපය බලන්න) යොදා ගැනීම පහසු ය. ප්‍රදර්ශක මෘදුකාංගය තුළින් ඔබට ලබා දෙන එම පෙර සැලසුම් පිළිබඳ ඔබ සෑහීමකට පත් නොවන අවස්ථාවල දී ඔබගේ නිර්මාණාත්මක හැකියාවන් යොදා ගනිමින් සහ වෙනත් පරිගණක මෘදුකාංග ද භාවිතයට ගනිමින් අවශ්‍ය පරිදි දෘශ්‍ය රාමු සැලසුම් සකසාගත හැකි ය. මෙම දෘශ්‍ය රාමු රටා සැලසුම් යොදා ගැනීමේ මූලික අරමුණ වන්නේ ඔබ විසින් නිර්මාණය කරනු ලබන ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමු අතර සමාන රටාවක් පවත්වා ගෙන යාම ය.

ඉහතින් සඳහන් කළ දෘශ්‍ය රාමු පසුතල, දෘශ්‍ය රාමු පිරිසැලසුම් සහ දෘශ්‍ය රාමු සැලසුම් යන කොටස් සියල්ල ප්‍රදර්ශක දෘශ්‍ය රාමුවල ඒකාබද්ධ ව පවතින ලක්ෂණ නිසා ඒ සියල්ල ම එකිනෙකට ගැළපෙන පරිදි ඔබගේ ප්‍රදර්ශකය නිර්මාණය කිරීමේ දී යොදා ගැනීමට සැලකිලිමත් විය යුතු ය.



**ක්‍රියාකාරකම 8.3**

ඔබ භාවිත කරන පරිගණකයේ ඇතුළත් කර ඇති ප්‍රදර්ශක මෘදුකාංගය විවෘත කොට එහි ඇති දෘශ්‍ය රාමු පිරිසැලසුම් සහ දෘශ්‍ය රාමු සැලසුම් පරීක්ෂාකර බලන්න. ඒ සඳහා ඔබ යොදාගත් මෘදුකාංගයේ නම ද එහි සංස්කරණය (Version) ද සටහන් කොට, පරීක්ෂා කිරීමේ දී ක්‍රියාත්මක කළ විධාන අනුපිළිවෙළින් ලියා දක්වන්න.

## 8.8 ප්‍රදර්ශකයක අඩංගු දෘශ්‍යරාමු තුළට සුදුසු පින්තූර හෝ රූ සටහන් ඇතුළු කිරීම

- ඔබ විසින් නිර්මාණය කරනු ලබන ප්‍රදර්ශකයට පින්තූර හෝ ආකෘති සටහන් ඇතුළත් කිරීමට අවශ්‍ය නම් ඊට ගැලපෙන දෘශ්‍යරාමු පිරිසැලසුමක් (layout) පළමු ව තෝරා ගන්න.

- එසේ නොවන අවස්ථාවක දී වුවත් ඔබේ පරිගණකයේ ගබඩා කර තිබෙන හෝ වෙනත් බාහිර විද්‍යුත් මෙවලමකින් හෝ වෙනත් මූලාශයකින් ලබා ගත් පින්තූර හෝ රූ සටහන් හෝ ඇතුළත් කළ හැක.

- මේ සඳහා මෙනු තීරුව (Menu bar) හෝ මෙවලම් තීරු (Tool bars) හෝ කෙටි මං යතුරු (Shortcut keys) භාවිත කළ හැක.

- ඔබට අවශ්‍ය පින්තූර හා අනෙකුත් ආකෘති සටහන් බාහිර මූලාශ්‍ර මගින් ලබාගැනීමේ දී එවැනි බොහෝ දේ බුද්ධිමය දේපළ අයිතියට නතු ව පවතින බැවින් ඒ සම්බන්ධයෙන් දැනට වලංගු ව පවතින නීති රීතිවලට අවනත ව ඒවා ලබාගැනීමට කටයුතු කළ යුතු ය.

## 8.9 ප්‍රදර්ශකයේ තෝරාගත් කොටස් සඳහා සුදුසු සජීවීකරණ ආදේශ කිරීම

ඔබ විසින් නිර්මාණය කරනු ලබන ප්‍රදර්ශකය ඉදිරිපත් කරන අවස්ථාවේ ප්‍රේක්ෂක අවධානය හොඳින් ලබා ගැනීම සඳහා සමස්ත නිර්මාණය ම ගුණාත්මක බවින් ඉහළ මට්ටමක පැවතිය යුතු වේ. ඒ අතර ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමු තුළ වූ විවිධ සංරචක වන අකුරු, සටහන් ආකෘති, රූප යනාදියට ද අවශ්‍ය පරිදි සජීවීකරණ (Animations) ආදේශ කිරීම තුළින් එය වඩාත් සිත්කලු කළ හැක. ඒ සඳහා අවශ්‍ය සියලු පහසුකම් ඔබ භාවිත කරන්නා වූ මෘදුකාංගය තුළින් ම ලබා දී ඇත. එසේ වුව ද ප්‍රේක්ෂකයන්ගේ වයස් මට්ටම් මත රඳා පවතින රුචි අරුචිකම් පිළිබඳ ව ද විෂය කරුණු අනුව ද සලකා බැලීමෙන් අනතුරුව පමණක් අවශ්‍ය පරිදි සජීවීකරණ ආදේශනය කළ යුතු ය.

ඔබ භාවිත කරන ප්‍රදර්ශක මෘදුකාංගය කුමක් වුවත් එහි එක් දෘශ්‍යරාමු පිරිසැලසුමකට ඔබ ඇතුළු කොට ඇති පාඨ කොටස් අකුරු, වචන, වාක්‍ය, ඡේද, පරිච්ඡේද වශයෙන් තෝරාගෙන (Selecting Text) ඒවාට සජීවීකරණ ලබා දිය හැකි අතර රූප හෝ වෙනත් ආකෘති ආදියට ද එපරිද්දෙන් ම සජීවීකරණ ආරෝපණය කළ හැක.



**ක්‍රියාකාරකම
8.4**

ඔබ ආරම්භ කළ නිර්මාණයට පින්තූරයක් ඇතුළු කිරීමට යෝග්‍ය දෘශ්‍යරාමු පිරිසැලසුමක් තෝරාගෙන ඊට ඔබගේ පරිගණකය තුළ ඇති රූපයක් ඇතුළු කර, එම රූපය පුළුල් ව පැමිණ තිරය තුළට හැකිළෙන අයුරින් සජීවීකරණයක් ආදේශ කරන්න.

## 8.10 අවශ්‍යතාවට ගැළපෙන පරිදි ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම

ඔබගේ අවශ්‍යතාවට ගැළපෙන පරිදි ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීමේ දී පහත දැක්වෙන මූලික කරුණු පිළිබඳ සැළකිලිමත් වන්න.

1. තම අරමුණ ප්‍රේක්ෂකයා වෙත ලබාදීමේ දී වඩාත් යෝග්‍ය වන මෙවලම කුමක් ද?

2. එය නිර්මාණය කරන්නේ කුමන විෂයයක් සඳහා ද?

3. කුමන වයස් කාණ්ඩයක, කොපමණ ප්‍රේක්ෂකයන් සංඛ්‍යාවක් සඳහා නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන්නේ ද?

4. ඉදිරිපත් කිරීමට ගතවන කාලය කොපමණ ද?

5. ඉදිරිපත් කරන්නේ කුමන පරිශ්‍රයක් හෝ වටපිටාවක් තුළ ද?

6. යොදාගන්නා ස්වරූපය හා භාවිත කරන අනෙකුත් මෙවලම් මොනවා ද?

7. අවශ්‍ය කරන විෂය කරුණු ලබාගන්නා වූ මූලාශ්‍ර මොනවා ද? ඒවා ලබා ගත හැකි ද?

8. ප්‍රදර්ශකය සඳහා කොපමණ දෘශ්‍ය රාමු සංඛ්‍යාවක් අඩංගු විය යුතු ද?

9. ඊට යොදා ගන්නා පසුබිමෙහි වර්ණ සහ හැඩතල මොනවා ද?

10. දෘශ්‍ය රාමු පිරිසැලසුම් සහ දෘශ්‍ය රාමු සැලසුම්වල උචිත අනුචිත බව පිළිබඳ විමර්ශනය සහ

11. ප්‍රදර්ශකයා මූලික වී ඉදිරිපත් නොකරයි නම් අවශ්‍ය පරිදි පසුබිම් කථන (Narrations) හා ශ්‍රව්‍ය දෘශ්‍ය (Audio visuals) කොටස් මෙන් ම සජීවීකරණ ආදේශක (Animation) හා චලන කොටස් (Video clips) යොදා ගත හැකි බව

යනාදිය ඒ අතර ප්‍රධාන වේ. එම කරුණු පිළිබඳ ව නිගමනයකට පැමිණි පසු ඔබ කළ යුතු වන්නේ තම පරිගණක යන්ත්‍රයෙහි ඇති ප්‍රදර්ශක මෘදුකාංගය භාවිත කරගනිමින් නිර්මාණයට පිවිසීම ය. භාවිත කරනු ලබන පරිගණක යන්ත්‍රවල අඩංගු වන මෙහෙයුම් පද්ධති අනුවත් ඒ ඒ යන්ත්‍රවල අන්තර්ගත ප්‍රදර්ශක මෘදුකාංග අනුවත් එක් එක් මෘදුකාංගවල සංස්කරණ අනුවත් වෙනස්වන බැවින් එක් නිශ්චිත පියවර රටාවකට ප්‍රදර්ශකය ගොඩනැගීමට නොහැකි වනු ඇත. එබැවින් තමා භාවිතයට ගෙන ඇති මෘදුකාංගයේ තිර දසුන්, විධාන තීරු ආදිය හොඳින් අධ්‍යයනය කොට තම ප්‍රදර්ශකය නිර්මාණය කිරීම සඳහා පිවිසිය යුතු ය.





පන්තිභාර ගුරුතුමා හෝ ගුරුතුමිය හෝ විසින් දෙන ලද කණ්ඩායම් ව්‍යාපෘතිය මේ වන විට නිමකොට අවසන් වී ඇතැයි සිතා එම ව්‍යාපෘතිය පිළිබඳ පාසලේ අනෙක් සිසුන් දැනුවත් කිරීමට සුදුසු වන පරිදි විද්‍යුත් ප්‍රදර්ශකවල භාවිත වන අංගෝපාංග සියල්ලක් ම අන්තර්ගත කොට ප්‍රදර්ශකයක් නිර්මාණය කරන්න.

## 8.11 ප්‍රදර්ශක මෘදුකාංග

ප්‍රදර්ශක මෘදුකාංගය කුමන ආකාරයක එකක් වුවත් එයට ප්‍රවේශ වීම බොහෝ දුරට සිදුවන්නේ එක ම රටාවකිනි. උදාහරණයක් වශයෙන් ගත් කල වින්ඩෝස් මෙහෙයුම් පද්ධති හරහා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි මෘදුකාංග ආරම්භයේ දී ඒකාකාර වූ ක්‍රමයක් අනුගමනය කරයි. පරිගණකය සූදානම් ස්වරූපයට පත් වූ පසු දක්නට ලැබෙන වැඩතලයෙහි (Desktop) පහළ වම් කෙළවරෙහි දක්නට ලැබෙන 'Start' බොත්තම මත ක්ලික් කොට ලැබෙන මෙනුවෙන් 'All Programs' තෝරා එහි දිස්වන මෘදුකාංග හෝ මෘදුකාංග ගොනු අතුරින් 'Microsoft Office' යන විකල්පයත් පසු ව ලැබෙන මෙනුවෙන් 'Microsoft Office PowerPoint 2003' යන විකල්පය තේරීමෙන් 'Ms Power Point' මෘදුකාංගයට පිවිසිය හැකි ය. (මෙහි දී මෘදුකාංග සංස්කරණය අනුව සහ මෙහෙයුම් පද්ධති මාදිලිය අනුව මෙනුවෙහි දිස්වන මෘදුකාංග නාමය දිස්වන ආකාරය වෙනස් විය හැකි ය.)

උදාහරණයක් ලෙස පහත දක්වා ඇති තිර සටහනේ 'Microsoft Office PowerPoint 2003' මෘදුකාංගයට පිවිසෙන රටාව නිරූපණය වේ.





රූපය 8.1 Microsoft Office PowerPoint මෘදුකාංගයට පිවිසෙන ආකාරය

## 8.12 ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම (Creating a presentation)

කුමන ආකාරයේ ප්‍රදර්ශක මෘදුකාංගයක් තෝරාගනු ලැබුවත් එමගින් ඔබට අවශ්‍ය ප්‍රදර්ශකය සැකසීමේ දී අනුගමනය කළ හැකි ක්‍රම කිහිපයක් ඇත. ඒවා ඒ ඒ මෘදුකාංගය මත සහ ඒ ඒ සංස්කරණ අනුව රඳා පවතින අතර අප මෙහි දී අවධානය යොමු කරන්නේ 'Microsoft' සමාගමේ නිෂ්පාදනයක් වන 'PowerPoint' ප්‍රදර්ශක මෘදුකාංගය වෙත ය. මෙම මෘදුකාංගය ද සංස්කරණ කීපයකින් දක්නට ඇතත් ඒවායේ පොදු ලක්ෂණ සැලකිල්ලට ගෙන ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම පිළිබඳ අවබෝධයක් ලබාදීම මෙහි අරමුණ වේ.

'Microsoft Office PowerPoint 2003' (මින් ඉදිරියට Ms PowerPoint ලෙස යොදා ගැනේ) සංස්කරණ උදාහරණයක් වශයෙන් ගෙන එමගින් ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම මෙහි දී විස්තර කර ඇති අතර ඒ ඒ පියවරයන්ට අදාළ පැහැදිලි කිරීම් පහත දක්වා ඇත. ඔබ 'Ms Powerpoint' මෘදුකාංගය ආරම්භ කළ විට දිස්වන තිරය රූපය 8.2 හි ආකාර වේ.




රූපය 8.2 Ms PowerPoint මෘදුකාංගයේ ආරම්භක තිරය

ඉහතින් දක්වා ඇති Ms PowerPoint ආරම්භක තිරයෙහි දකුණුපස ඇති කාර්ය කවුළුවේ (Task pane) නව ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීම සඳහා පිවිසිය යුතු 'New' යන පැනල ශීර්ෂය යටතේ දක්නට ලැබෙන ප්‍රදර්ශකය නිර්මාණය සඳහා පිවිසීමට තෝරා ගත හැකි අවස්ථාවන් තුන පහත දක්වේ.

- Blank Presentation
- From Design Template සහ
- From AutoContent Wizard

මෙහි දී ද ඔබ තෝරා ගන්නා විකල්ප අවස්ථාවට අනුව ඔබගේ ප්‍රදර්ශකය නිර්මාණයට ඉඩකඩ සැලසේ. ඒ ඒ අවස්ථාවේ ඔබ ඉදිරියේ ඇති පරිගණක තිරයේ දිස්වන මූලික විධාන සමූහය ලිඛිත ව ඇතුළත් කර ඇති විධාන තීරුව (Menu Bar) සහ එම විධාන සමූහය රූපසටහන් වශයෙන් දිස්වන පරිදි අන්තර්ගත කොට නිමවා ඇති රූපමය මෙලවම් තීරු (Toolbar) හැරුණු විට විවිධ දෘශ්‍යරාමු පිරිසැලසුම්, උපදෙස් (Instructions), තේරීම් අවස්ථා (Choices) මෙන් ම විධාන බොත්තම් (Command Buttons) යනාදිය හොඳින් පිරික්සීමෙන් සහ ඒවා මනාව හැසිරවීමෙන් ඔබට අවශ්‍ය ප්‍රදර්ශකය ක්‍රමානුකූල ව නිර්මාණය කරගත හැකි ය.




**ක්‍රියාකාරකම 8.5**

ඔබ උගත් පාඩමක් සඳහා ඔබගේ පරිගණකයේ ඇතුළත් කර ඇති ප්‍රදර්ශක මෘදුකාංගයක් ඇසුරින් දෘශ්‍යරාමු පිරිසැලසුමක් තෝරා ප්‍රදර්ශකයක් නිර්මාණය කරන්න.

## දෘශ්‍යරාමුවෙහි ප්‍රමාණය (Slide Size) සකස් කිරීම

ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමුවල ප්‍රමාණය (Slide Size) සකස් කර ගැනීම තම අවශ්‍යතාවට අනුව පිටු සැකසුම් ක්‍රියාවලියේ සිට සිදුවිය යුතු ය. මෙහි දී දෘශ්‍යරාමු වර්ගය, ඒවායේ ප්‍රමාණයන්, දෘශ්‍ය රාමු පසුතලයේ දිශානතිය (Slide Oriantation) යන කරුණු සියල්ලට ම අවශ්‍ය තේරීම් මගින් පිටු සැකසීම සකස් කරගත හැක.
(රූපය 8.3 බලන්න)





රූපය 8.3 Ms PowerPoint මෘදුකාංගයේ පිටු සැකසුම් තිරය

මෙම පිටු සැකසුම් තිරය 'Ms PowerPoint' මෘදුකාංගයේ 'File' නැමැති විධාන තීරුවේ 'Page Setup' යන විකල්පය යටතේ ලබා ගත හැකි ය. මෙහි දී දෘශ්‍ය රාමු වර්ගය හා ඒවායේ ප්‍රමාණයන් තෝරා ගැනීම කළ හැකි අතර ම ඒවායේ දිශානතිය යනාදිය ගැන ද අවධානය යොමුකොට ඇත.

## දෘශ්‍යරාමු පිරිසැලසුම් (Slide Layouts)

පිටු අවශ්‍ය ප්‍රමාණයට අනුව සැකසීමෙන් අනතුරුව තමන් නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන ප්‍රදර්ශකයට සුදුසු දෘශ්‍ය රාමු ආකෘති තෝරා ගැනීම කරනු ලබයි. ඒ සඳහා 'Slide Layouts' කාර්ය සටහනේ දැක්වෙන ආකෘති අතුරින් තමන්ට සුදුසු පරිදි දෘශ්‍ය රාමු ආකෘති තෝරා ගැනීම කළ හැකි ය. 'Ms PowerPoint' හි 'Slide Layout' අඩංගු කාර්ය සටහන පහත පරිදි වේ (රූපය 8.4). එය ලබා ගැනීම සඳහා 'Format' විධානයේ 'Slide Layout' යන විකල්පය තේරීම හෝ 'Formatting Toolbar' හි ඇති 'Slide Layout' යතුර තද කිරීමෙන් හෝ තිරයේ දකුණු පසින් ඇති කාර්ය සටහනෙහි ශීර්ෂයෙහි දක්නට ලැබෙන පහළට දිවෙන ඊ හිස (Drop down button) තද කර 'Slide Layout' යන අවස්ථාව තේරීම හෝ කළ හැකි ය.




රූපය 8.4 Ms PowerPoint මෘදුකාංගයේ 'Slide Layout' හි අඩංගු කාර්ය සටහන

තම ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමු තුළට ඇතුළු කිරීමට බලාපොරොත්තු වන අන්තර්ගතයන්ට අනුකූල වන පරිදි ඉහත ආකෘති තෝරා ගැනීමෙන් අනතුරුව අකුරින් ලියා දක්වන කොටස් (Text), රූප (Pictures), වගු (Tables), ප්‍රස්ථාර (Charts / Graphs) යනාදිය පහසුවෙන් ඊට ඇතුළු කිරීමට ඔබට ඉඩකඩ සලසා දෙනු ලැබේ. උදාහරණයක් ලෙස 'Slide Layout' හි අඩංගු කාර්ය සටහනේ 'Other layouts' යන කොටසින් 'Title ,Text and Clip Art' යන ආකෘතිය තෝරාගත් විට එම දෘශ්‍යරාමුව තුළට අකුරින් ලියා දක්වන කොටස් මෙන් ම, ප්‍රදර්ශක මෘදුකාංග ගැලරියේ ඇති රූප (Clip Art) අවශ්‍ය පරිදි යෙදීමට පහසුකම් සැලසෙයි. එහි දී ඔබ කළ යුත්තේ අකුරින් ලිවිය යුතු කොටස් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ආකෘතියේ ඇති 'Clip Art' නමැති රූපය මත මූසිකය "click" කිරීම ය. එවිට රූප ගැලරිය විවෘතවී සුදුසු රූපයක් තෝරා ගැනීමට ඉඩ සැලසෙන අතර තමන් තෝරාගත් රූපය අදාළ පරිදි ස්ථාන ගත කර ගැනීමට 'Insert' නමැති විධානය යොදා ගත යුතු ය.

## දෘශ්‍ය රාමු සැලසුම් (Slide Design)

අවශ්‍ය පරිදි දෘශ්‍ය රාමු සියල්ල සකස් කර ගැනීමෙන් පසු කළ යුතු වන්නේ ප්‍රදර්ශකයට වඩාත් උචිත යයි තමන්ට හැඟෙන දෘශ්‍ය රාමු සැලැස්මක් තෝරා ගැනීමයි. මෙසේ දෘශ්‍ය රාමු සැලැස්ම තෝරා ගැනීම ප්‍රදර්ශකය නිර්මාණය කිරීමට පෙර හෝ එය නිමවන අතරතුර දී හෝ සැකසීම අවසානයේ දී හෝ කළ හැකි අතර 'Ms PowerPoint' හි දෘශ්‍ය රාමු රටා ලබා ගැනීම සඳහා 'Format' විධානයේ 'Slide Design' යන විකල්පය තේරීම හෝ 'Formatting Toolbar' හි ඇති 'Slide Design' බොත්තම මත "Click" කිරීමෙන් හෝ තිරයේ දකුණු පසින් ඇති කාර්ය සටහනෙහි ශීර්ෂයෙහි දක්නට ලැබෙන පහළට දිවෙන ඊ හිස මත මූසිකය "Click" කර 'Slide Design – Design Template' යන අවස්ථාව තේරීම කළ හැකි ය. තමන් විසින් තෝරා ගන්නා ලද දෘශ්‍ය රාමු රටාව එක් දෘශ්‍ය රාමුවකට හෝ කිහිපයකට හෝ සියල්ලට ම හෝ අවශ්‍ය පරිදි යෙදිය හැකි ය. ඔබට අවශ්‍ය නම් ඒ ඒ දෘශ්‍ය රාමුවලට වෙනස් වූ දෘශ්‍යරාමු සැලසුම් යොදාගත හැකි ය. එය සිදුකරනු ලබන්නේ ඔබ තෝරාගත් දෘශ්‍යරාමු සැලසුම් සහිත රාමුවේ දකුණු පසින් දක්නට ලැබෙන පහළට දිවෙන ඊ හිස සහිත බොත්තම තද කර අදාළ විකල්පය තේරීමෙනි.

'Ms PowerPoint' මෘදුකාංගයේ දෘශ්‍ය රාමු රටා දැක්වෙන කාර්ය සටහනෙහි තිර පිටපතක් රූපය 8.5 හි දක්වා ඇත.





රූපය 8.5 Ms PowerPoint මෘදුකාංගයේ දෘශ්‍ය රාමු සැලසුම් (Slide Design) සහිත කාර්ය කවුළුව

ඉහතින් දක්වා ඇති 'Ms PowerPoint' මෘදුකාංගය සමග ලැබෙන පෙර සැකසුම් දෘශ්‍ය රාමු රටා ආකෘති ඔබගේ අවශ්‍යතාවට නොගැළපෙන විට ඔබට අවශ්‍ය පරිදි දෘශ්‍ය රාමු රටා සකස් කර ගැනීමට ද හැකියාව ඇත. ඒ සඳහා 'View' යන මෙනු විධානයට අදාළ 'Master' යන විකල්පයේ 'Slide Master' යන තේරීම් අවස්ථාව යොදා ගත හැකි ය.

## දෘශ්‍ය රාමු පසුතලය

ඔබ විසින් නිම කරන ලද ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමුවල පසුතලය (Slide Background) ඔබට අවශ්‍ය නම් වෙනස් කර ගත හැකි ය. එහි දී පසුබිමේ පාට වෙනස් කිරීම, හැඩතල රටා වෙනස් කිරීම, පසුබිමට පින්තූර ආරෝපණය කිරීම ආදිය කළ හැකි වන අතර මෙය සිදු කරනු ලබන්නේ 'Format' මෙනුවෙහි ඇති 'Background' යන අවස්ථාව තේරීම මගිනි.

'Ms PowerPoint ' මෘදුකාංගයේ දෘශ්‍ය රාමු පසුතලය වෙනස් කිරීමට රූපය 8.6 හි දැක්වෙන කවුළුව යොදා ගත හැකි ය.




රූපය 8.6 Ms PowerPoint මෘදුකාංගයෙහි දෘශ්‍ය රාමු පසුතල සැකසුම් තිර සටහන

## දෘශ්‍ය රාමු අන්තර්ගතයනට සජීවීකරණ එක්කිරීම

ඔබගේ ප්‍රදර්ශකයේ දෘශ්‍ය රාමු තුළ වූ ලිඛිත කොටස්, පින්තූර (Pictures/ Graphics or Images) ආදී වශයෙන් වූ අන්තර්ගතයනට සුදුසු සජීවීකරණ ඇතුළු කිරීම තවත් එක් අවශ්‍යතාවක් වන අතර ඒ සඳහා කළ යුත්තේ අදාළ ලිඛිත කොටස් හෝ පින්තූර හෝ තෝරා ගැනීමෙන් අනතුරුව 'Slide Show' නමැති මෙනු විධානයට පිවිස 'Animation Schemes' හෝ 'Custom Animation' යන විකල්ප අවස්ථා යොදා ගැනීම ය. ඒ අනුව තමන්ට අභිමත පරිදි චලනයන් හැඩ ගැස්වීමට ඒ ඒ තේරීම්වල දී ඔබට ලැබෙන කාර්ය සටහන් හා ඒ තුළ ඇති බහුවිධ චලන ස්වරූපයන් අත්හදා බැලිය හැකි ය.

## දෘශ්‍යරාමු අන්තර්ගතයනට ශබ්ද එක්කිරීම

ඔබ දෘශ්‍යරාමු තුළ සජීවීකරණ හඳුන්වා දී ඇති කොටස්වලට හෝ නිශ්චල රූපවලට හෝ වෙනත් ඕනෑ ම කොටසකට ගැළපෙන පරිදි ශබ්ද එකතු කිරීමේ හැකියාව ද මෙවැනි ප්‍රදර්ශක මෘදුකාංගවල අන්තර්ගත ව ඇති පහසු ක්‍රමයකි. ඒ අනුව 'Ms PowerPoint' මෘදුකාංගය යොදා ගැනීමේ දී ද එහි 'Custom Animation' යොදා ගන්නා අවස්ථාවේ දී ම මෘදුකාංගයේ අන්තර්ගත ශබ්ද ඔබට අවශ්‍ය පරිදි හැසිරවිය හැකි ය. එම ශබ්ද ඔබගේ ප්‍රදර්ශකයට නොගැළපේ නම් ඔබ විසින් ම නිර්මාණය කර ගන්නා ලද හෝ සොයා ගන්නා ලද වෙනත් ශබ්ද ද ඒ සඳහා යොදා ගත හැකි ය. අවශ්‍ය විටෙක ඔබගේ කටහඬ පසුබිමින් ලබා දීම ද කළ හැකි ය. මේ සඳහා ඔබට ඔබගේ පරිගණක

යන්ත්‍රයේ ශබ්ද පටිගත කර ගැනීමට අවශ්‍ය වන උපකරණ (Sound recording device) සහ ඊට අවශ්‍ය මෘදුකාංග ද තිබිය යුතු ය. 'Ms PowerPoint' මෘදුකාංගය මගින් ශබ්ද ගොනුකර ගැනීමට ඉඩකඩ සලසා දී ඇති අතර ඒ සඳහා අමතර ව අවශ්‍ය වන්නේ ශබ්දය පටිගත කර ගැනීමේ උපකරණයක් (Microphone) පමණි.

'Ms PowerPoint' මෘදුකාංගයේ පෙර සැලසුම් ශබ්ද (Inbuilt sound clips) පමණක් තෝරාගන්නේ නම් එය 'Custom Animation' යටතේ ඔබ විසින් තෝරාගන්නා ලද විකල්පයේ දකුණුපස ඇති පහළට දිවෙන ඊ හිස සහිත යතුර තද කොට 'Effect options' යන අවස්ථාව වරණය කිරීමෙන් කළ හැකි ය.

ඔබගේ ම කටහඬින් විස්තරයක් පසුබිමින් දීමට අවශ්‍ය නම් ඒ සඳහා 'Insert' නමැති මෙනු විධානයට පිවිස 'Movies and Sounds' නමැති විකල්පය තෝරා 'Record Sound' යන්න තෝරා ගත යුතු ය. එමගින් හඬ තැන්පත් කර ගැනීමට හා අවශ්‍ය පරිදි ඇතුළු කර ගැනීමට හැකි වන අතර ඒ අයුරින් ම ඔබට අවශ්‍ය චලන රූප, වීඩියෝ පට සහ ශබ්ද යනාදිය විවිධ මාධ්‍ය හරහා ලබා ගනිමින් දෘශ්‍ය රාමු තුළට ඇතුළු කර ගැනීමට හැකි වනු ඇත.

## විද්‍යුත් ප්‍රදර්ශකයක් දැක ගත හැකි විවිධ ස්වරූප


ඔබ විසින් නිර්මාණය කරනු ලබන ප්‍රදර්ශකය ඊට තොරතුරු ඇතුළු කිරීමට භාවිත කරන්නා වූ ස්වරූපයේ සිට එය අවසානයේ ප්‍රේක්ෂකයාට ඉදිරිපත් කිරීම දක්වා වූ ක්‍රියාවලිය තුළ විවිධ ස්වරූපවලින් දැකීමට සැලැස්විය හැකි ය. ඒ සඳහා 'View' මෙනුව යොදාගනු ලබන අතර එහි ඇති විවිධ මෙනු නිරූපකය / අයිතම යටතේ ප්‍රදර්ශකයේ අඩංගු දෘශ්‍යරාමු දැක ගත හැකි ය. ඒ අනුව ප්‍රදර්ශකයේ අඩංගු දෘශ්‍ය රාමු,

- Normal
- Slide Sorter
- Slide Show
- Notes Page

යන ස්වරූපවලින් දැක ගත හැකි ය. ඉහත ස්වරූප අතුරින් 'Slide Show' - (F5 යතුර තද කිරීමෙන් ලැබේ) යනු ප්‍රේක්ෂකයා වෙත ප්‍රදර්ශකය ඉදිරිපත් කිරීමේ දී බහුල ව ම යොදා ගනු ලබන ස්වරූපය වන අතර අනෙක් ස්වරූප ප්‍රදර්ශකය සකසන්නාට හෝ එය ඉදිරිපත් කරන්නාට බෙහෙවින් උපකාරී වේ. 'View Modes' ලබා ගැනීමට ඔබට 'View' මෙනුව වෙනුවට ප්‍රදර්ශක සැකසුම් තිරයේ දකුණුපස පහළ කෙළවරෙහි දිස්වන 'View' බොත්තම තේරීම ද කළ හැකි ය.

## දෘශ්‍ය රාමු අතර මාරුවීම

ප්‍රේක්ෂකයා වෙත ප්‍රදර්ශකය ඉදිරිපත් කිරීමේ දී එක් දෘශ්‍ය රාමුවකින් වෙනත් දෘශ්‍ය රාමුවකට පිවිසෙන අවස්ථාවේ දී ඒ බව දැක්වීමට මෙන් ම ප්‍රේක්ෂක අවධානය රඳවා ගැනීම ද අරමුණු කර ගෙන දෘශ්‍ය රාමු අතරට මාරුවීම් ස්වරූප (Slide Transition) ඇතුළු කරනු ලබයි. ප්‍රදර්ශකයේ එක් එක් දෘශ්‍ය රාමු වෙනස් වන විට එක ම මාරුවීම් ස්වරූපයක් හෝ එකිනෙකට විවිධ වෙනස්වීම් හෝ මාරුවීම් ස්වරූප හෝ ආදේශ කළ හැකි ය. මේ සඳහා ඔබ කළ යුත්තේ අවශ්‍ය දෘශ්‍යරාමු තෝරා ඒවාට 'Transition Modes' ආදේශ කිරීමයි. මෙහි දී 'Slide Show' මෙනුවෙහි 'Slide Transition' යන විකල්පය තෝරා ඒ අනුව තිරයේ වම්පස දිස්වන කාර්ය සටහනෙන් ලැබෙන අවස්ථා ප්‍රයෝජනයට ගත හැකි ය. (රූපය 8.7 බලන්න)




රූපය 8.7 Ms PowerPoint මෘදුකාංගයේ දෘශ්‍ය රාමු අතර මාරුවීම කාර්ය සටහනේ තිර පිටපතකි.



**ක්‍රියාකාරකම 8.6**

විද්‍යුත් ප්‍රදර්ශකයක් නිර්මාණය කිරීමේ දී ඉහතින් සඳහන් කර ඇති මූලික ලක්ෂණවලට අමතර ව ඔබට වැදගත් යැයි හැඟෙන තවත් කරුණු සොයා ඒවා ලැයිස්තු ගත කරන්න.



**පැවරුම් 8.3**

1. ඔබ උගත් ගණිත පාඩමක් වඩාත් සිත් ඇදගන්නා සුලු ආකාරයට සහ පහසුවෙන් සිසුනට අවබෝධ කරගත හැකිවන පරිදි විද්‍යුත් ප්‍රදර්ශකයක් මගින් නිර්මාණය කරන්න. ඒ සඳහා ඔබ කැමති හෝ පහසුවෙන් ලබාගත හැකි විද්‍යුත් ප්‍රදර්ශක මෘදුකාංගයක් භාවිත කරන්න.

2. පන්තිකාමරයේ දී සාමාන්‍ය පාඩමකින් පැහැදිලි නොවන සංකල්ප විද්‍යුත් ප්‍රදර්ශකයක් ඇසුරින් ලබා දිය හැකි බව තහවුරු කිරීම සඳහා ඔබ කැමැති විෂයයකට අදාළ වන පාඩමක් විද්‍යුත් ප්‍රදර්ශක මෘදුකාංගයක් ඇසුරින් නිර්මාණය කරන්න.